සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 80 | S | I,II

නම: ....

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

කාලය පැය 1 විනාඩි 30

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01) පරිගණක දෘඩාංගයක් නොවන්නේ,
1. මෙහෙයුම් පද්ධතිය 2. සංදර්ශකය 3. දෘඩ තැටිය 4. මූසිකය

02) විද්‍යුත් පැතුරුම්පතක භාවිතා කරනු ලබන ශ්‍රිතයක් නොවන්නේ,
1. =SUM 2. =AVERAGE 3. =TOTAL 4. =MIN

03) සකසනයේ (Processor) වේගය මනිනු ලබන ඒකකය වන්නේ,
1. ගිගා බයිට් 2. හර්ට්ස් 3. තප්පර 4. බිට්ස්

04) දත්ත ආදානය මෙන්ම ප්‍රතිදානය සිදු කරනු ලබන උපාංගයකි,
1. සංදර්ශකය 2. ස්පර්ෂ තිරය 3. වෙබ් කැමරාව 4. ප්‍රොජෙක්ටර්

05) ක්ෂුද්‍ර පාලකයක අන්තර්ගත කොටසක් නොවන්නේ,
1. මතකය 2. පද්ධති හෝරාව 3. පර්යන්ත උපාංග 4. සංවේදක

06) නූතන පරිගණක මෘදුකාංග නිෂ්පාදනයේ ප්‍රබල ජාත්‍යන්තර සමාගමක් වන්නේ,
1. NOKIA සමාගම 2. Microsoft සමාගම
3. Google සමාගම 4. Yahoo සමාගම

07) අප විසින් මකා දමන ලද (files) ලිපි තාවකාලිකව ගබඩා වන්නේ,
1. Recycle බඳුන තුළය 2. my computer තුළය 3. Folder Option තුළය 4. Task Bar තුළය

08) පරිගණකයක ප්‍රධාන ආචයන උපාංගය ලෙස හැඳින්විය හැක.
1. UPS 2. සකසනය 3. දෘඩ තැටිය 4. ROM

09) පරිගණක ජාලයක ප්‍රධාන වාසියක් වන්නේ,
1. තොරතුරුවලට අඩු ආරක්ෂාව 2. දත්ත තොරතුරු විනාශ වීම
3. වේගවත් දත්ත හුවමාරුව 4. වෛරස් ව්‍යාප්තිය

10) ගැලීම් සටහන් ඇඳීමේ දී  සංකේතයෙන් දැක්වෙන්නේ,
1. ආදානය සඳහා පමණි 2. සැකසීම් පමණි
3. ආදානය හා ප්‍රතිදානය 4. ප්‍රතිදානය පමණි

(ල. 2 x 10 = 20)

- **හිස්තැන් පුරවන්න.**

(දෘඩ තැටියේ ධාරිතාව / ප්‍රධාන මතකය / සකසනය / සකසනයේ වේගය / කෙවෙනි)

1. පරිගණකයෙහි මොලය ලෙස හඳුන්වන්නේ .... යි.

2. පරිගණකයකට පර්යන්ත උපාංග සම්බන්ධ කිරීම .... හරහා සිදු කරයි.

3. පරිගණක පිරිවිතර සලකා බැලීමේ දී තාක්ෂණික පිරිවිතරයක් ලෙස .... හඳුනා ගත හැකිය.

4. පරිගණකය ක්‍රියාත්මක වන අවස්ථාවේ දී දත්ත හා උපදෙස් තාවකාලිකව තැන්පත් කරනු ලබන්නේ .... තුලය.

5. පරිගණකයක කාර්ය සාධනය රඳා පවතින එක් ලක්ෂණයක් වන්නේ .... යි.

(ල. 2 x 5 = 10)

• පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

1. වර්තමානයේ පරිගණකයට බොහෝ උපාංග සම්බන්ධ කිරීමට භාවිතා කරන කෙවෙනිය කුමක් ද?
....

2. පරිගණකයක් මිල දී ගැනීමේ දී සලකා බලා තාක්ෂණික නොවන කරුණු 03 ක් ලියන්න.
....
....
....

3. 3R සංකල්පයේ කියවෙන ක්‍රමවේද 03 මොනවාද?
....
....
....

4. ගැලීම් සටහනක පාලන ව්‍යුහ 03 මොනවාද?
....
....
....

(ල. 2 x 10 = 20)

• පහත දැක්වෙන කියමන් "සත්‍ය" ද නැත්නම් "අසත්‍ය" ද යන්න ඒවාට ඉදිරියෙන් ලියන්න.

1. සියළුම විද්‍යුත් අපද්‍රව්‍ය නැවත භාවිතයට ගත නොහැක. ....

2. ඇඹරි යුගල කේබල පරිගණක ජාලකරණයේ දී භාවිතා නොකරයි. ....

3. පද්ධති හෝරාව යනු ක්ෂුද්‍ර පාලකයක අන්තර්ගතය කි. ....

4. වෙබ් අඩවි සැලසුම් හා සංවර්ධනය කිරීම වෙබ් සංවර්ධකගේ කාර්යයකි. ....

5. Linux යනු මෙහෙයුම් පද්ධතියකි. ....

(ල. 2 x 5 = 10)

• පහත දැක්වෙන්නේ පුද්ගලයින් 05 දෙනෙකු සතියක කාලයක් තුල භාවිතා කරන ලද පෙට්‍රල් ලීටර් ප්‍රමාණයන් ය. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

	A	B	C	D	E	F	G	H
1	නම	සඳුදා	අඟහරුවාදා	බදාදා	බ්‍රහස්පතින්දා	සිකුරාදා		
2	ආකාශ්	03	04	03	06	03		
3	ඉමෙත්	01	01	00	02	01		
4	සිනුර	00	10	11	10	15		
5	හිරුන්	10	12	15	11	17		
6	අරිදු	08	05	07	10	12		
7								

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

1. ආකාශ් මුළු සතිය පුරා භාවිතා කල පෙට්‍රල් ප්‍රමාණය G2 කෝෂයට ලබා ගැනීමට අදාල ශ්‍රිතය ලියන්න.
....

2. අඟහරුවාදා දින සියළු දෙනා භාවිතා කල පෙට්‍රල් ප්‍රමාණයේ සාමාන්‍යය C7 කෝෂයට ලබා ගැනීමට අදාල ශ්‍රිතය ලියන්න. ....

3. සිකුරාදා දින භාවිතා කල අවම පෙට්‍රල් ප්‍රමාණය F7 කෝෂයට ලබා ගැනීමට අදාල ශ්‍රිතය ලියන්න.
....

4. සඳුදා දින භාවිතා කල උපරිම පෙට්‍රල් ප්‍රමාණය B7 කෝෂයට ලබාගැනීමට අදාල ශ්‍රිතය ලියන්න
....

5. පුද්ගලයින් සියළු දෙනා දින 05 තුල භාවිතා කල පෙට්‍රල් ප්‍රමාණයන් දැක්වීම සඳහා සුදුසු ප්‍රස්ථාර වර්ග 02 ක් ලියන්න.
.... (ල. 2 X 5 = 10)

- **A හා B සංඛ්‍යා දෙකක් අතරින් විශාල සංඛ්‍යාව සෙවීම සඳහා ගැලීම් සටහන පහත දැක්වේ. එහි හිස්තැනට ගැලපෙන වචන තෝරා හිස්තැන් පුරවන්න.**



(A ආදානය කරන්න , නැත , B ආදානය කරන්න , B විශාල සංඛ්‍යාව වේ , ඔව්) (ල. 2 x 5 = 10)

- **පහත දැක්වෙන පරිගණක පද්ධති සංරචකයන්ට අදාළව උදාහරණ ලියන්න.**

1. ආදාන උපාංග
   A .... B .... C ....
2. ප්‍රතිදාන උපාංග
   D .... E .... F ....
3. සකස් කිරීමේ උපාංගය
   G ....
4. ආචයන උපාංග
   H .... I .... J ....

(ල. 2 x 10 = 20)

Past Papers Wiki

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - 9 ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

- අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) 1 02) 3 03) 2 04) 2 05) 4 06) 2 07) 1 08) 3 09) 3 10) 3

- හිස්තැන් පුරවන්න.

1. සකසනය
2. කෙවෙනි
3. දෘඩ තැටියේ ධාරිතාව
4. ප්‍රධාන මතකය
5. සකසනයේ වේගය

- පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

1. USB
2. අදාළ පිළිතුරු
3. භාවිතය අවම කිරීම, නැවත නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය
4. අනුක්‍රමය, තේරීම, වරණය

- පහත දැක්වෙන කියමන් "සත්‍ය" ද නැත්නම් "අසත්‍ය" ද යන්න ඒවාට ඉදිරියෙන් ලියන්න.

1. අසත්‍ය 2. අසත්‍ය 3. සත්‍ය 4. සත්‍ය 5. සත්‍ය

- පහත දැක්වෙන්නේ පුද්ගලයින් 05 දෙනෙකු සතියක කාලයක් තුල භාවිතා කරන ලද පෙට්‍රල් ලීටර ප්‍රමාණයන් ය. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

1. =Sum (B2 : F2)
2. =Average (C2 : C6)
3. =Min (F2 : F6)
4. =Max (B2 : B6)
5. ස්ථම්භ ප්‍රස්ථාර, තීර ප්‍රස්ථාර

- A හා B සංඛ්‍යා දෙකක් අතරින් විශාල සංඛ්‍යාව සෙවීම සඳහා ගැලීම් සටහන පහත දැක්වේ. එහි හිස්තැනට ගැලපෙන වචන තෝරා හිස්තැන් පුරවන්න.

1/2 - A ආදානය කරන්න , 1/2 - B ආදානය කරන්න
3 නැත
4 ඔව්
5 - B විශාල සංඛ්‍යාව වේ

LOL Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF ALL BOOKS

Including Exercise Books, CR Books, and B5 Books



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

Order Term Test Papers, Short Note Books, Workbooks, and Revision Books

in Sinhala, English & Tamil Medium



LOL BOOK STORE

Cash on Delivery and KOKO Payment Available

Website: www.lol.lk

Whatsapp - 0717774440

Order all your books from LOL Book Store!